# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 29 දරන සාක්ෂි (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2005 සැප්තැම්බර් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 සැප්තැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 4.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2005 අංක 29 දරන සාක්ෂි (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 සැප්තැම්බර් මස 20 වන දින]

එල්. ඩී.–ඕ. 14/2005.

## (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2005 අංක 29 දරන සාක්ෂි (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. 14 වන අධිකාරය වූ සාක්ෂි ආඥාපනතේ 90අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 14 වන අධිකාරයේ 90අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි " බැංකුකරුවන්ගේ පොත්" යන යෙදුමෙහි අර්ථ කථනයේ "අන් සියලු පොත් ඇතුළත් වේ" යන වචන වෙනුවට "අන් සියලු පොත් සහ ඉලෙක්ට්‍රොනික, චුම්බක, දෘෂ්‍ය හෝ වෙනත් ක්‍රමයකින් තොරතුරු පද්ධතියක ගබඩා කර තිබෙන දත්ත ඊට ඇතුළත් වේ ; තව ද" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි "සහතික කළ පිටපත" යන යෙදුමෙහි අර්ථ කථනයේ "නම හා තිල නාමය යොදා දිනය ද සඳහන් කොට ඒ සහතිකය අත්සන් කර තිබිය යුතු ය". යන වචන වෙනුවට, "නම හා තිල ධුර නාමය යොදා දිනය ද සඳහන් කොට ඒ සහතිකය අත්සන් කර තිබිය යුතු අතර, බැංකුකරුවන්ගේ පොත්පත්, ඉලෙක්ට්‍රොනික, චුම්බක, දෘෂ්‍ය හෝ වෙනත් ක්‍රමයකින් තොරතුරු පද්ධතියක ගබඩා කළ දත්තවලින් සමන්විත වන අවස්ථාවක එම දත්තවල මුද්‍රිතයක් සහ 1995 අංක14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තියට අනුකූලව දෙන ලද දිවුරුම් පත්‍රයක් හෝ තත්කාලීනව යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරියේ පරිගණක සාක්ෂි ඉදිරිපත් කිරීම හා සම්බන්ධව බලපවත්නා නීතියකට අනුව නියම කරනු ලැබිය හැකි වෙනත් සහතික කිරීමේ ලේඛනයක් ඊට ඇතුළත් විය යුතු ය.". යන වචන ආදේශ කිරීමෙන්.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.